# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 දෙසැම්බර්

සමාජීය විද්‍යා පීඨය

## සංවර්ධන අධ්‍යයන (නව නිර්දේශය)

## සංවර්ධන භාවිතයන් සඳහා පර්යේෂණ ක්‍රමවේද DVST– E 3025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. සංවර්ධන සැලසුම්කරණයේ දී පර්යේෂණ වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. කිසියම් සංවර්ධන යෝජනා ක්‍රමයකින් ප්‍රතිලාභ ලැබූවන් කොතෙක්දුරට එම ව්‍යාපෘතිය පිළිබඳව තෘප්තිමත් වන්නේ දැයි සොයාබැලීම සඳහා පර්යේෂණයක් සිදුකරන ආකාරය සංක්ෂිප්තව පැහැදිලි කරන්න. (ලකුණු 20)

03. 'පර්යේෂණ ගැටලුව' නිවැරදිව අර්ථකථනය කිරීම පර්යේෂණයක සාර්ථකත්වයට හේතුවන අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 20)

04. පර්යේෂණයක 'සාහිත්‍ය විමර්ශනය (Literature Review)' කිරීමේ අරමුණු හා ප්‍රයෝජන පරීක්ෂා කරන්න. (ලකුණු 20)

05. සංවර්ධන ව්‍යාපෘතියකට අදාළව ශක්‍යතා අධ්‍යයනයක් (Feasibility Study) කිරීමේ අවශ්‍යතාව පරීක්ෂා කරන්න. (ලකුණු 20)

06. නියැදීම (Sampling) හඳුන්වා, ප්‍රමාණාත්මක පර්යේෂණ සඳහා උචිත නියැදුම් ක්‍රම දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 20)

07. පර්යේෂණ යෝජනාවලියක අන්තර්ගත විය යුතු මූලිකාංග උචිත නිදසුනක් ඇසුරින් පරීක්ෂා කරන්න. (ලකුණු 20)

08. පහත මාතෘකා අතුරින් <u>දෙකකට (02)</u> කෙටි සටහන් සපයන්න.

    අ) ආනුභාවික පර්යේෂණ (Empirical Research)

    ආ) උද්ගාමී ප්‍රවේශය (Inductive Approach)

    ඇ) ව්‍යුහාත්මක සම්මුඛ සාකච්ඡා (Structured Interviews )

    ඈ) පාරිසරික බලපෑම් තක්සේරුකරණය (Environmental Impact Assessment - EIA)

(ලකුණු 10 x 2 = 20)

************************************